දිනය - 2022.09.12

**<u>මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ 2022.09.12 දින පැවති මහා සභාවේ වාර්තාවයි.</u>**

2022.09.12 වන දින පෙ.ව 09.00 ට පමණ ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලි මැතිතුමියගේ ප්‍රධානත්වයෙන් සභා කටයුතු ආරම්භ කරන ලදී.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**
අද දින සභා රැස්වීම සඳහා පැමිණ සිටින ඔබ සියලුම දෙනා ඉතාමත් ආදරයෙන් පිළිගන්නා අතර ප්‍රථමයෙන් ආගම සිහි කරමු.

## 01. පසුගිය රැස්වීම් වාර්තාව සභාවේ සම්මත කිරීම.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**
අද දින සභා කටයුතු ආරම්භ කර සිටින අතර මීළඟට පසුගිය සභාවේ වාර්තාව සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
පසුගිය අගෝස්තු මාසයේ පහළොස් වන දින පැවති මාසික සභා රැස්වීමේදී ඔබතුමියගේ උපදෙස් අනුව වතු ආශ්‍රිත ප්‍රදේශවල ජංගම සේවාවක් මගින් වෙළඳ බලපත්‍ර ලබාදීම සම්බන්ධව ප්‍රකාශ කර තිබුණා. මේ පිළිබඳව අනෙකුත් ගරු මන්ත්‍රීවරුන් ද තමන්ගේ අදහස් ප්‍රකාශ කර තිබුණා. ඒ අනුව ලබාගත් තීරණයට අනුව කටයුතු සිදුකර තිබෙනවාද?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
එම තීරණයට අනුව අදාළ ස්ථාන වෙත ලිපි යොමු කර තිබෙනවා. ඒ සමගම වෙළඳ සංගමයට ද දැනුම් දීමක් සිදු කර තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ප්‍රීමා තිරිඟු පිටි පිළිබඳව මා විසින් ජූලි මාසයේ සභා රැස්වීමේදී යෝජනාවක් ඉදිරිපත් කර තිබුණා. මස්කෙළිය නගරයේ එකම එක ප්‍රීමා පිටි නියෝජිතයෙක් පමණයි සිටින්නේ. පසුගිය කාල වකවානුව තුළදී පිටිවල මිල වැඩි කළ අවස්ථාවේදී කිසිදු කඩයකට පිටි බෙදාහැරීම් නොකර, මිල වැඩි වූ පසු විකුණා තිබෙනවා. මෙම අවස්ථාවේදී පාරිභෝගිකයින් පිටි මිලදී ගැනීමට නොහැකිව බොහෝ අපහසුතා වලට පත්වී සිටින ආකාරය දැකගන්න ලැබුණා. මේ පිළිබඳව මෙම සභාවේ දී තීරණයක් ලබාගෙන හිටපු ජනාධිපති තුමා වෙත ද ලිපි යොමු කර තිබුණා. එමෙන්ම නගරයේ සිටින වෙළෙඳ ප්‍රජාව ද ගෙන්වා අපි සාකච්ඡා කර තිබුණා. සියළු දෙනාගෙන් අත්සන් ලබාගෙන ලිපි යොමු කළා. නමුත් තීරණයක් ලැබුණේ නැහැ. ඉන් අනතුරුව නව ජනාධිපතිවරයා වෙත ද මේ පිළිබඳව ලිපියක් යොමුකරන ලෙසට මා ඉල්ලා සිටියා. මේ සඳහා කිසිදු විසඳුමක් ලැබුණේ නැහැනේ?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
එම කාරණාව පිළිබඳව ලිපි යොමු කර ඒ සඳහා වූ පිළිතුරු ලැබී තිබෙනවා. ලිපි ඉදිරිපත් කරන අවස්ථාවේදී එම ලිපිය ඉදිරිපත් කරනවා.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
දැනටමත් එහි දින දෙකක් පිටි සඟවා තබමින් බෙදාහැරීම් නොකර සිටිනවා. තවත් දෙදෙනෙකුට මෙම නියෝජිත කටයුතු සිදුකිරීමට අවශ්‍ය කටයුතු කරදෙන ලෙසටයි මම ඉල්ලා සිටින්නේ. ඒ නිසා මේ සඳහා වහාම කටයුතු කරන්න.

<u>**ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)**</u>
සුපිරි වෙළඳසැල් මඟින් ලබාදෙන බිල්පත් දෙමළ භාෂාවෙන් ලබාදීම සම්බන්ධව මා විසින් කරුණු ඉදිරිපත් කර සිටියා. ඒ සඳහා ක්‍රියාමාර්ගයක් ලබා ගන්නා ලෙසටද ඉල්ලා සිටියා.

<u>**ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)**</u>
ඉතා කඩිනමින් මේ සඳහා වූ කටයුතු සිදුකළ යුතුයි.

<u>**ගරු මන්ත්‍රී කේ.නිත්‍යානන්දන් මැතිතුමා (ලං.ක.කො)**</u>
සංශෝධන ද සමග පසුගිය සභා වාරයේ වාර්තාව නිවැරදි හා සත්‍ය වාර්තාවක් බවට මම යෝජනා කරමි.

<u>**ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)**</u>
එම යෝජනාව මා ස්ථිර කරමි.

**තීරණ අංක 01**
2022.08.15 දිනැති සභා වාර්තාව නිවැරදි හා සත්‍ය වාර්තාවක් බවට සභාව විසින් අනුමත කරන ලදී.

## 02. සභාපති විසින් කරනු ලබන විශේෂ නිවේදන.

<u>**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**</u>
වතු කම්කරුවන් ගේ වැටුප වශයෙන් රුපියල් දහසක් ලබාදිය යුතු බවට අධිකරණයේ තීන්දුවක් ලබා දී තිබෙනවා. නමුත් මස්කෙළිය වැවිලි සමාගම විසින් එකී වැටුප ලබා නොදී කම්කරුවන් විශාල අසීරුතාවයකට පත්කර තිබෙනවා. තේ කොල නොයවා ඒවා අත්හිටුවීමට ක්‍රියාමාර්ග ගනු ලබනවා. මේ පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් ද අවධානය යොමු කරන්නේ නම් සුදුසු බවට ප්‍රකාශ කරමි. ලබාදී ඇති තීන්දුවට අනුව ඔවුන් වැටුප ගෙවන්නේ නැහැ. කිලෝ එකකට රුපියල් පනහක් පමණයි ගෙවන්නේ. මේ නිසා කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනය කරනු ලබන තේ කොල පිටත් කිරීම සඳහා ඉඩ නොදෙන බවට වෘත්තීය සමිති මඟින් තීරණය කර තිබෙනවා.

<u>**ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)**</u>
ගරු සභාපතිතුමිය ගේ විශේෂ කතාවේදී වතු කම්කරුවන්ගේ වැටුප් ගැටළුව පිළිබඳව ප්‍රකාශ කර තිබුණා. අද දින උදෑසන සිදු වූ සිදුවීමක් මම ඉදිරිපත් කිරීමට කැමතියි. මීට විනාඩි පහකට පෙර ගරු ජීවන් තොන්ඩමන් මැතිතුමාගේ ලේකම්තුමාට සහ ලංකා කම්කරු කොංග්‍රස් සභාපති සෙන්දිල් තොණ්ඩමන් මැතිතුමා වෙත මේ පිළිබඳ තොරතුරු මම ලබා දී තිබුණා. කම්කරුවන් සියලුම දෙනා වැඩ කළ යුතුයි. තේ කොල අපනයන කිරීමේදී පමණක් බාධා සිදු කළ යුතු බව මාගේ අදහසයි. අපනයන කිරීමේදී බාධාවක් සිදුවන්නේ නම් සමාගම්කරුවන් ජනතාව වෙත අදාල වැටුප ලබාදීමට සූදානම් වේවි යන එක මගේ අදහසයි. මේ පිළිබඳව මරේ කොට්ඨාශයට අදාළ කළමනාකරු, වතු සභාපතිවරුන් ගෙන්වා “වෘත්තීය සමිති කියන පරිදි ඔබ සියළුදෙනා ක්‍රියා කරන්න, දින තුනකට පමණයි අපි වැඩ ලබාදෙන්නේ, ඔබලා කොහොමද දීපාවලිය සමරන්නේ කියන එක අපි බලාගන්නම්" යනුවෙන් පවසා තිබෙනවා. අද දින පැවැත්වීමට නියමිත සාකච්ඡාවේදී සභාපතිවරුන් සියළු දෙනාම වෘත්තීය සමිති භේදයකින් තොරව එකමුතුව හොඳ තීරණයක් ඉල්ලා තිබෙනවා. ඒ සඳහා ලබාදුන් පිළිතුර තමයි ඉහත සඳහන් වෙන්නේ. ඒ නිසා වහාම මේ සඳහා

තීරණයක් ලබාගත යුතුයි. සියළු දෙනාම එකමුතුව කටයුතු කළහොත් මස්කෙලිය වැවිලි සමාගමට හොඳ පාඩමක් උගන්වන්න පුළුවන්.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මස්කෙළිය ඇතුළු සියළු ප්‍රදේශවල මෙය සිදු කරනවා.

## 03. සභාව වෙත ලැබී ඇති සංදේශ, පෙත්සම් හා පැමිණිලි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මීළඟට සභාව වෙත ලැබී ඇති ලිපි සහ පැමිණිලි ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිමි.

**ලිපි අංක 01**
යොමු කරන්නා - ජනාධිපති ලේකම් කාර්යාලය.
විෂය - ප්‍රීමා පිටි බෙදාහැරීම් නියෝජිත ආයතනය සම්බන්ධ ලිපිය සඳහා ලැබී ඇති පිළිතුරු ලිපිය.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ගරු සභාපතිතුමියනි, මෙහි ඇති ප්‍රශ්නය වන්නේ අපට තිබෙන්නේ ප්‍රීමා පිටි නියෝජිත ආයතන එකක් පමණයි. මස්කෙළිය, සාමිමලේ වෙසෙන දාහකට අධික පිරිසක් මෙම වෙළඳ නියෝජිතයාව විශ්වාස කරගෙනයි සිටින්නේ. තිරිඟු පිටි මිල ඉහළ යන විට මොහු පිටි සඟවනවා. පසුව මිල ඉහළ ගියාට පසු නැවත විකුණනු ලබනවා. සියළුම වෙළඳසැල් හිමියන් මෙම තිරිඟු පිටි වෙළඳ නියෝජිත ආයතනය එපා කියා අත්සන් කර තිබෙනවා. සභාවේ මන්ත්‍රීවරුද අත්සන් කර තිබෙනවා. ගරු සභාපතිතුමියද අත්සන් කර මෙය ජනාධිපතිතුමා වෙත යොමුකර තිබෙනවා. සුබ්‍රමනියම් මන්ත්‍රීතුමා පැවසූ ආකාරයට මොහු මෙම පිටි වාහන වලින් වෙනත් නගර කරා රැගෙන යනවා. කොළඹටද රැගෙන යනවා. මෙම වෙළඳ නියෝජිත ආයතනයේ පිටි තබාගෙන ඒවා මෙම ප්‍රදේශයේ ජනතාවට ලබානොදී පිට ප්‍රදේශ කරා රැගෙන යනවා නම් එම නියෝජිතභාවයෙහි කිසි තේරුමක් නැහැ. අප කියා සිටින්නේ මොහු ප්‍රීමා පිටි වෙළඳ නියෝජිතභාවයෙන් ඉවත් කරන්න හෝ නැතිනම් වෙනත් සුදුසු කිහිපදෙනෙකුට නියෝජිතභාවය ලබාදෙන්න කියලයි. ජනාධිපති කාර්යාලයෙන් නවවෙනි මස 12 වන දිනට පෙර සභාපතිතුමිය වෙත පිළතුරු ලබාදෙන ලෙස දන්වා තිබුණත් මේ දක්වා අදාල අමාත්‍යාංශයෙන් කිසි පිළිතුරක් ලැබී නැහැ. මේ සඳහා මෙම මස අවසාන වන විට පිළිතුරක් නොලැබුණහොත් අපට පාරට බැස ප්‍රශ්නයක් ඇති කිරීමට සිදුවන බව මම පවසා සිටිනවා.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
මස්කෙළිය නගරයේ වෙළඳ සංගමයක් තියෙනවද නැද්ද කියා දන්නේ නැහැ. ශක්තිමත් වෙළඳ සංගමය නැති වීම නිසා මස්කෙළිය නගරයට පමණක් හානියක් වී නැහැ, මස්කෙළිය ප්‍රදේශයට අයත් සියළු දෙනාටම හානියක් වී තිබෙනවා. වෙළෙඳ සංගමය ශක්තිමත් කරන ලෙසට මම මේ සභාවට යෝජනාවක් ඉදිරිපත් කරනවා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
වෙළෙඳ සංගමය ශක්තිමත් කරන ලෙසට අපට පවසන්න බැහැ.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
මෙම කාරණාව සම්බන්ධයෙන් අපි ප්‍රාදේශීය ලේකම් වෙත ලිපියක් යොමු කරමු.

**<u>ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)</u>**

අපි කතා කරන්නේ පාරිභෝගිකයින්ට යහපතක් සිදු කරන කරුණු පිළිබඳවයි. පාරිභෝගික ආරක්ෂණ සංගමයක් පිහිටුවා එය ලියාපදිංචි කර ආයතනයක් වශයෙන් පරිවර්තනය කරන අවස්ථාවක දී, වෙළඳ සංගමයට විරුද්ධව ද අපිට කතා කළ හැකි බව මාගේ අදහසයි. ජනතාවටද සෘජුවම මෙම ආයතනය සමඟ සම්බන්ධ වීමේ අවස්ථාවක් උදාවේවි.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළේ ඇත්තටම හොඳ කාරණාවක්. මේ වගේ කාර්යයක් ඉටු කළ හැකි ද යන එක පිළිබඳව සොයා බලන්න. පාරිභෝගික සංගමයක් ක්‍රියාත්මක වන්නේ නම් එය යහපතක් වේවි. ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කාරණාව මම ස්ථිර කරමි.

**තීරණ අංක 02**

එම කාරණාව පිළිබඳව ප්‍රාදේශීය ලේකම් වෙත ලිපියක් යොමු කිරීමට තීරණය කරන ලදී.

**ලිපි අංක 02**

යොමු කරන්නා - ප්‍රවාහන අධිකාරිය.

විෂය - අධික ලෙස බස් ගාස්තු අය කිරීම පිළිබඳ වූ ලිපිය.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**

මෙම බස් ගාස්තු පිළිබඳව පසුගිය සභා වාරයේදී මම සඳහන් කර තිබුණා. එදින සභාව අවසන් වී මා නිවසට යන අවස්ථාවේදී මේ පිළිබඳව වාහන රියදුරන් මා සමඟ දුරකථනයෙන් සම්බන්ධ වී ප්‍රශ්න කළා. ඒ තරම් ඉක්මනට මෙම කාරණාව පිටතට ගියේ කොහොමද කියා දන්නේ නැහැ. ජනතාවගේ  යහපත උදෙසා තමයි මා මෙම කාරණාව සඳහන් කළේ.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

ගරු මන්ත්‍රීතුමනි, මෙම කාරණාව පිළිබඳව ඔබතුමා කතා කළ එක පමණක් නොව මෙම කාරණාව සම්බන්ධයෙන් ඔබතුමාගේ ප්‍රදේශයේ  කණ්ඩායමක් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ජීවන් තොන්ඩමන් මැතිතුමා  හමුවීම සඳහා ඒ පිළිබඳව එතුමාගේ ලේකම් මා සමග කතා කළා. මාර්ගය අබලන් වී ඇති බැවින් බස් ගාස්තු අධික ලෙස අය කරන බවට පවසා තිබෙනවා.

**ලිපි අංක 03**

යොමු කරන්නා - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය.

විෂය - මස්කෙළිය සමෘද්ධි බැංකු ගොඩනැගිල්ල  පිළිබඳවූ ලිපිය.

**<u>ගරු මන්ත්‍රී එස්. ඒ. දිසානායක මැතිතුමා. (ශ්‍රී.ල.පො.පෙ.)</u>**

එම ලිපියට අදාලව පෙර සභාවේදී යෝජනා කළේ, එම ස්ථානයේ නිවසක් අරගෙනයි කුළියට මෙය කරගෙන යන්නේ. නමුත් මස්කෙළිය ග්‍රාම නිලධාරී කාර්යාලය අසල රජය විසින් සමාජ ශාලාවක් ලක්ෂ 20 ක වියදමින් ඉදිකර තිබෙනවා. අපි පවසා සිටියේ එය පෞද්ගලික අංශයට ලබාදෙනවාට වඩා රජය මගින් එයට ජනෙල් දෙකක් හා දොරක් සවිකර දුනහොත් මෙය භාවිතයට ගතහැකි බවයි. ලක්ෂ විස්සක මුදලක් වියදම් කර සකස් කර  මෙය දැන් භාවිතයට නොගෙනයි තිබෙන්නේ. සමෘද්ධි බැංකුවට අපට කිව හැකියි මේ තිබෙන අඩුපාඩුකම් සකස් කර මෙය පවත්වාගෙන යන්න

කියා. පෞද්ගලික ආයතනයකට රු. 25000.00 ක් හෝ රු. 30000.00 ක කුළියක් ලබාදෙනවාට වඩා රජය මඟින් මෙය ලස්සනට සකස්කර ගත්තානම් හොදයි. මෙය සභාවෙන් අපි ඉල්ලා සිටිමු.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
බැංකුව ආරම්භ කරන්නේ නම් සියළු දේවල් විධිමත්ව සිදු කරන්න ඇති නේද? මෙම කාරණාව හාස්‍ය ජනකයි. නැවතත් මෙම කාරණාව පිළිබඳව පැහැදිලි කරමින් ලිපියක් යොමු කරන්න.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මීට පෙරත් එලෙසමයි ලිපියක් යොමු කළේ. එම ලිපියටයි ඔවුන් පිළිතුරු යොමු කර තිබෙන්නේ.

**<u>ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>** )
මාස හයකට කියන්නේ මෙය සෙල්ලමක්. ඔවුන් විහිළුවක් කළේ. රජයේ ආයතනයක් කියන්නේ අවුරුදු පහකටවත් තිබිය යුතුයි. නැතිනම් මොවුන් එය ගන්නේ නැහැ. මෙය බොරුවක්. මෙය ඇස්බැන්දුම් වැඩක්. කාවහරි තෘප්තිමත් කරන්න සිදු කළ කාර්යයක්. බැංකුවේ ඇති මුදලින්ම ගොඩනැගිල්ලක් ඉදිකරන්න තිබුණා. එකී ලිපිය සදහා වූ පිළිතුර පිළිගන්න බැහැ. මෙම කාරණාව සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් සහ දිස්ත්‍රික් ලේකම් වෙත ගරු සභාපතිතුමිය දැනුවත් කිරීමක් සිදු කරන්න.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
සමෘද්ධි බැංකුවක් අවශ්‍ය බවට මෙම සභාවේ බොහෝ අවස්ථාවලදී කතාකර, මහන්සි වී අවසානයේදී මෙම උප කාර්යාලයක් ලැබුණා. දැනට එම කාර්යාලයත් ක්‍රියාත්මක නැහැ කියන එක පිළිගන්න බැහැ. මේ සම්බන්ධයෙන් නැවතත් ලිපියක් යොමු කරන ලෙසට ඉල්ලා සිටිමි.

**<u>ගරු උප සභාපති පී.පී.ප්‍රදීපන් මැතිතුමා (ලං.ක.කො)</u>**
මෙම සමෘද්ධි බැංකුව පිළිබඳ කරුණු සම්බන්ධයෙන් අපි අවධානය යොමු කළ යුතුයි. විවෘත කරන ලද සමෘද්ධි කාර්යාලය සමෘද්ධි අධිකාරිය යටතේ ක්‍රියාත්මක වෙනවාද කියන එක පිළිබඳව මට සැකයක් පවතිනවා. මස්කෙළිය නගරයේ සමෘද්ධි කාර්යාලයක් තිබෙන අවස්ථාවකදී ජනතාව නෝර්වුඩ් බැංකුවට යනවා කියන එක පිළිබඳව අපි විමසිලිමත් විය යුතුයි.

**ලිපි අංක 04**
යොමු කරන්නා - පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය.
විෂය - සභා වාර්තා නිරීක්ෂණය පිළිබඳ ලිපිය.

**ලිපි අංක 05**
යොමු කරන්නා - විෂය භාරකරු.

විෂය - ශ්‍රී ලංකා පළාත් පාලන සංසදය හා කැනඩා පළාත් පාලන ආයතනය සමඟ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කමිටුව අනුමත කරගැනීම පිළිබඳ වූ ලිපිය.

**තීරණ අංක 03**
ව්‍යාපෘති කමිටුව සභාව විසින් ඒකමතිකව පිළිගන්නා ලදී.

දිනය - 2022.09.12

## 04. මුදල් හා අනෙකුත් කමිටු වාර්තා ඉදිරිපත් කිරිම.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**
මීළඟට මුදල් සහ අනෙකුත් කමිටු වාර්තා සභාවට ඉදිරිපත් කරමු.

ගරු මන්ත්‍රී කේ. සුරේෂ් කුමාර් මැතිතුමා විසින් මුදල් කමිටු වාර්තාවේ සඳහන් කරන ලද ළමා උද්‍යානය නඩත්තු කිරීම පිළිබඳ වූ ලිපිය සම්බන්ධයෙන් අදහස් පළ කළ අතර බ්‍රවුන්ස්වික් ප්‍රදේශයේ අතහැර දමා ඇති ළමා උද්‍යානය සභාව යටතට පත්කර ගැනීම පිළිබඳවද අදහස් ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**
ට්‍රස්ට් ආයතනය සමඟ සාකච්ඡා කර මෙම කාරණාව සම්බන්ධයෙන් තීරණයක් ලබා ගනිමු.

ගරු මන්ත්‍රී කේ. සුරේෂ් කුමාර් මැතිතුමා විසින් ළමා උද්‍යානය, ටෙන්ඩර් ක්‍රමය යටතේ ලබාදීම සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කරන ලදී.

ගරු මන්ත්‍රී එස්. සුබ්‍රමනියම් මැතිතුමා විසින් මස්කෙළිය පොදු ක්‍රීඩාපිටිය සඳහා වූ විදුලි සම්බන්ධතාවය ලබා ගැනීම සම්බන්ධයෙන් අදහස් දක්වන ලදී.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**
මෙම කාරණාව සම්බන්ධයෙන් ට්‍රස්ට් ආයතනය සමඟ සාකච්ඡා කළ අවස්ථාවේ ඉතිරි මුදලක් නැති බවට ඔවුන් පැවසුවා. විදුලි සම්බන්ධතාවයක් ලබා ගැනීම සඳහා ප්‍රතිපාදන නැති බවටද පැවසුවා. මේ සම්බන්ධයෙන් ඇස්තමේන්තුවක් සකස් කරන ලෙසට ඉංජිනේරුවරයෙකුගෙන් අපි ඉල්ලා සිටියා. මුදල සම්බන්ධයෙන් අපි කටයුතු කරන බවටද පැවසුවා. නමුත් ඔහු පැමිණෙන බව පවසා අවසානයේ දී පැමිණියේ නැහැ. තවද මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා සභාව සුළු වේලාවකට පොදු සභාවක් වශයෙන් ප්‍රකාශ කිරීමට අනුමැතිය ඉල්ලා සිටිමි.

**ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
සභාව පොදු සභාවක් වශයෙන් පරිවර්තනය කිරීම සඳහා මම යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)**
එම යෝජනාව මා ස්ථිර කරමි.

සභාව සුළු වේලාවකට පොදු සභාවක් වශයෙන් පරිවර්තනය කරන ලදී.

**තීරණ අංක 04**
එම අවස්ථාවේදීම මහජන ක්‍රීඩා පිටිය සම්බන්ධව සාකච්ඡා කර ක්‍රීඩා පිටියට විදුලිය ලබාදීම සම්බන්ධයෙන් මස්කෙළිය විදුලි අධිකාරීතුමා සමඟ සාකච්ඡා කිරීමට තීරණය කරන ලදී.

ගරු මන්ත්‍රී පී. රාජ්කුමාර් මැතිතුමා විසින් මුදල් කමිටු වාර්තාවේ සඳහන් කරන ලද ගිනි කපොලු පිරිසිදු කිරීම, වීථි ලාම්පු සවිකිරීම, මත්ද්‍රව්‍ය තුරන් කිරීම, දීපාවලි සැණකෙළිය සහ තාවකාලික වෙළඳ කුටි පිළිබඳ කරුණු සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කරන ලදී.

මුදල් කමිටු වාර්තාවේ සඳහන් පරිදි 2022 වර්ෂයේ දීපාවලි උත්සවය නිමිත්තෙන් විනෝද සැණකෙළි පැවැත්වීම, තාවකාලික වෙළඳ කුටි ටෙන්ඩර් මගින් ලබා දීම වැනි කරුණු පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් විසින් සාකච්ඡා කිරීමෙන් අනතුරුව සිදු කළ යුතු සංශෝධන පිළිබඳව තීරණය කරන ලදි.

ගරු මන්ත්‍රී එස්. සුබ්‍රමනියම් මැතිතුමා විසින් මුදල් කමිටු වාර්තාවේ සඳහන් කරන ලද බස් රථ වලින් පිටතට අපද්‍රව්‍ය විසිකරන පුද්ගලයන්ට විරුද්ධව ක්‍රියාමාර්ග ලබා ගැනීම සහ ගිනි කපොලු පවිත්‍ර කිරීම පිළිබඳව අදහස් දක්වන ලදී.

ගරු මන්ත්‍රී එස්. ඒ. දිසානායක මැතිතුමා විසින් මුදල් කමිටු වාර්තාවේ සඳහන් කරන ලද ගිනි කපොලු පවිත්‍ර කිරීම පිළිබඳව අදහස් දක්වන ලදී.

ගරු මන්ත්‍රී කේ. රාජ්කුමාර් මැතිතුමා විසින් මුදල් කමිටු වාර්තාවේ සඳහන් කරන ලද ගිනි කපොලු පවිත්‍ර කිරීම පිළිබඳව අදහස් දක්වන ලදී.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ගරු මන්ත්‍රීවරුනි, මෙම කාරණාව සම්බන්ධයෙන් විවාද කිරීමට අවශ්‍ය නැහැ, එම ස්ථානවලට යාබදව පිහිටි නිවෙස්වල ගැහැණු ළමුන් සිටින නිසයි ඔවුන්ගේ ආරක්ෂාව සැලකිල්ලට ගනිමින් මම මෙය පැවසුවේ, මමත් එම ස්ථානයට ගොස් පරීක්ෂාකර සිටියා. ඉතාමත් අයහපත් තත්වයෙනුයි තිබෙන්නේ.

**<u>ගරු මන්ත්‍රී ටී.වසන්තකුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
මුදල් කමිටු වාර්තාව නිවැරදි බවට මම යෝජනා කරමි.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
එම යෝජනාව මා ස්ථිර කරමි.

**<u>2022.09.05 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව නිර්දේශයෙන් පසු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.</u>**

**කාරණා අංක 01**
මස්කෙළිය ප්‍රාදේශීය සභාවට අයත් ළමා උද්‍යානය නඩත්තු කිරීම සම්බන්ධව සාකච්ඡා කරන ලදී.

**තීරණ අංක 05**
ළමා උද්‍යානය මනා ලෙස නඩත්තු කර ,එය විවෘත කරන වේලාව සහ වසන වේලාව සඳහන් කර උද්‍යානය ඉදිරිපිට දැන්වීම් පුවරුවක් සවි කිරීම සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 02**
මස්කෙළිය නගරයේ නවතා තබා ඇති බස් රථ වල සිට අපද්‍රව්‍ය පිටතට විසි කිරීම පිළිබඳව සාකච්ඡා කරන ලදී.

**තීරණ අංක 06**
උක්ත කරුණ සම්බන්ධයෙන් අපද්‍රව්‍ය පිටතට විසි කරන පුද්ගලයන්ගෙන් දඩ මුදලක් අය කිරීමට හෝ ඒ සඳහා වෙනත් ක්‍රියා මාර්ගයක් ගැනීමට කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

දිනය - 2022.09.12

**කාරණා අංක 03**

මස්කෙළිය නගරයේ ඇති ගිනි කපොල්ල (Fire Gap) තුල පැන නැගී තිබෙන සෞඛ්‍යමය ප්‍රශ්න හා එය මත්ද්‍රව්‍ය භාවිතා කිරීම සඳහා යොදා ගැනීම සම්බන්ධයෙන් මුදල් කමිටුව විසින් සාකච්ඡා කරන ලදී.

**තීරණ අංක 07**

අදාළ ගිනි කපොල්ල සුද්ධ පවිත්‍ර කිරීමට කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 04**

මේ වනවිට රටතුල තැපැල් ගාස්තුව ඉහළ නංවා ඇති බැවින් කාර්යාලයේ තැපැල් කටයුතු සඳහා ලබාදෙන ලද මුදල ප්‍රමාණවත් නොවන හෙයින් ඒ සඳහා වැඩි මුදලක් ලබා ගැනීමට විෂය නිලධාරිනිය විසින් ඉදිරිපත් කළ ලිපිය මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලදී.

- රු 15.00 ක් ව තිබූ සාමාන්‍ය ලිපි තැපැල් කිරීමේ ගාස්තුව මේ වනවිට
  රු 50.00 ක් දක්වාත්
- රු 45.00 ක් ව තිබූ ලියාපදිංචි ලිපි තැපැල් කිරීමේ ගාස්තුව රු 110.00 දක්වාත් වැඩිවී ඇත. (බර අනුව ගාස්තුව මීට වඩා ඉහළ අගයක් ගනී)
- Speed Post ලිපි සඳහා ද ගාස්තුව වැඩිවී ඇත.

**තීරණ අංක 08**

උක්ත කරුණ සම්බන්ධයෙන් එහි ඇති අවශ්‍යතාවය සහ තැපැල් ගාස්තු වැඩිවීම පිළිබඳව සලකා බලා මාසික තැපැල් ගාස්තුව වශයෙන් ලබාදුන් රු 10000.00 ක මුදල රු 20000.00 දක්වා ඉහළ නංවා ලබා දීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 05**

මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ සිටින කමිටු සාමාජිකයන්හට ලබාදෙන ගමන් ගාස්තුව ඉහළ නැංවීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී එස්. සුරේෂ්කුමාර් මැතිතුමා විසින් ලබාදුන් ලිපිය කමිටුවට කමිටුවට ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 09**

උක්ත කරුණ සම්බන්ධයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා වෙත ලිපියක් යොමු කිරීමට කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 06**

මස්කෙළිය නගරයේ තිබෙන වෙළඳ ආයතනවල මිල දර්ශනය ප්‍රදර්ශනය කිරීම පිළිබඳව සාකච්ඡා කරන ලදී.

**තීරණ අංක 10**

උක්ත කරුණ සම්බන්ධයෙන් නගරයේ වෙළඳ සංගමය වෙත ලිපියක් යොමු කිරීමට මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

දිනය - 2022.09.12

**කාරණා අංක 07**

කාර්යාලයේ CCTV කැමරා සවි කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

**තීරණ අංක 11**

කාර්යාලය තුල CCTV කැමරා සවි කිරීම කඩිනම් කරන ලෙසට කමිටුව විසින් නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 08**

මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රතිඵල හා මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී කේ.යෝගේන්ද්‍රන් මැතිතුමා විසින් ඉදිරිපත් කළ ලිපිය කමිටුවට ඉදිරිපත් කරන ලදී

**තීරණ අංක 12**

උක්ත කරුණ සම්බන්ධයෙන් එක් කොට්ඨාශයකින් දෙදෙනා බැගින් කැදවා මේ පිළිබඳව දැනුවත් කිරීමටත් වීදි නාට්‍යයක් ඉදිරිපත් කිරීම සඳහා කටයුතු සූදානම් කිරීමටත් මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 09**

වීදි ලාම්පු සහ සභා කටයුතු සඳහා Sound System ගෙන්වා ගැනීම සඳහා ලැබී තිබූ මිළ ගණන් කමිටුවේදී විවෘත කරන ලදී.

<table>
<tr><th></th><th colspan="3">Dinapala (Pvt) Ltd</th><th colspan="3">Robert Agencies (Pvt) Ltd</th><th colspan="3">Hon electronics</th></tr>
<tr><th>Specification</th><th>Brand</th><th>Warrenty</th><th>Amount</th><th>Brand</th><th>Warrenty</th><th>Amount</th><th>Brand</th><th>Warrenty</th><th>Amount</th></tr>
<tr><td>Efective power - 400W (2 boxes)</td><td rowspan="9">Ahuja</td><td rowspan="9">1 year</td><td rowspan="9">197,120.00</td><td rowspan="9">Ahuja</td><td rowspan="9">1 year</td><td rowspan="9">307,380.00</td><td rowspan="9">Universal</td><td rowspan="9">1 year</td><td rowspan="9">89,850.00</td></tr>
<tr><td>Deiver Unit - 10'' Subwoofer</td></tr>
<tr><td>10'' Satellite speaker</td></tr>
<tr><td>Impedance - 4.0HM</td></tr>
<tr><td>Frequency response - 40Hz - 20KHz</td></tr>
<tr><td>Signal - Noise Ratio :>92db</td></tr>
<tr><td>WHTH LED/EQ/USB/SD</td></tr>
<tr><td>Wireless microphone</td></tr>
<tr><td>Microphone with wire</td></tr>
</table>

දිනය - 2022.09.12

| Item | Brand | Street Lamp cobra 50W (With arm and bracket) | Street Lamp cobra 100W (With arm and bracket) | Street Lamp cobra 150W (With arm and bracket) |
|---|---|---|---|---|
| Lotus tradways (3 years) | China | 16,800.00 | 22,400.00 | 28,900.00 |
| NMI Infra (3 years) | Green | 17,000.00 | 26,500.00 | 36,370.00 |
| UK Electricals (1 year) | | - | 12,500.00 | 17,995.00 |
| New Gem city (3 years) | Gem Light | 12,000.00 | 16,500.00 | 19,750.00 |
| DSA Electricals (3 years) | Galle | 12,800.00 | 19,500.00 | 26,500.00 |
| Asian Electrical (3 years) | | 16,000.00 | 23,000.00 | 30,000.00 |

**තීරණ අංක 13**
ශබ්ද විකාශන යන්ත්‍ර සඳහා උසස් තත්ත්වයෙන් යුත් භාණ්ඩ සහ අවම මිල ගණන් ඉදිරිපත් කල හොන් ඉලෙක්ට්‍රොනික් ආයතනයෙන් මිලදී ගැනීමටත්, වීථි ලාම්පු සඳහා උසස් තත්ත්වයෙන් අවම මිල ගණන් ඉදිරිපත් කල නිව් ජෙම් සිටි ආයතනයෙන් මිලදී ගැනීමටත්, කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 10**
මස්කෙළිය නගරයේ තිබෙන ආපනශාලා පිළිබඳව සාකච්ඡා කරන ලදී.

**තීරණ අංක 14**
ආපනශාලා තුල ඇති ආහාරවල තත්වය පරීක්ෂා කිරීම සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරී මහතා දැනුවත් කර ඔහු වෙත ලිපියක් යොමු කිරීමට කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 11**
2022 වර්ෂයේ දීපාවලී උත්සවය වෙනුවෙන් තාවකාලික වෙළද කුටි සහ විනෝද සැණකෙළිය පැවැත්වීම සම්බන්ධයෙන් ආදායම් පරීක්ෂකතුමා විසින් කමිටුව වෙත ලිපියක් ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 15**
2022 වර්ෂයේ දීපාවලී උත්සවය වෙනුවෙන් තාවකාලික වෙළද කුටි ලබාදීම සහ විනෝද සැණකෙළිය පැවැත්වීම සඳහා විවෘත ටෙන්ඩර් කැඳවීම සඳහා පුවත්පත් දැන්වීමක් පල කිරීමට කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

## 05. යෝජනා

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මීළඟට ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමාගේ යෝජනාව ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)</u>**
අපගේ මෙම සභාව නව සභාවක් වශයෙන් ආරම්භ කර පලමුවන සැසිවාරය අවසන් වී මාස හයක් වැඩියෙන්ද අපි ගත කර තිබෙනවා. නමුත් මුදල් තත්වය පිළිබඳව අපි වැඩි අවධානයක් යොමු නොකර කාලය අපතේ යවා තිබෙනවා කියන එක සභාව පිළිගත යුතුයි. මම සෑම සභා වාරයකදීම මුදල් තත්වය පිළිබඳව අදහස් ඉදිරිපත් කර තිබෙනවා. මෙහිදී හෝටල් ලියාපදිංචිය සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කරන්න තිබුණා. මේ වන විට හෝටල් වල ප්‍රමාණය වැඩි වශයෙන් දක්නට ලැබෙනවා. නල්ලතන්නිය ප්‍රදේශයේ හෝටල් වල සංඛ්‍යාව වැඩි වී තිබෙනවා. මෙම හෝටල් සඳහා සභාව අයකරන ප්‍රමාණය ඉතාමත් අඩුවෙන් පවතිනවා. දැන් පවතින මෙම මුදල් ප්‍රමාණය සංශෝධනය කළ යුතුයි. දැනට අපගේ මුදලේ අගය පහත වැටී තිබෙනවා. අවුරුදු හතළිහකට පෙර යෝජනා කළ මෙම මුදල දැනට ප්‍රමාණවත් නැහැ. එනිසා කඩිනමින් ක්‍රියාත්මක වී සංශෝධනයක් ගෙන ආ යුතුයි. මීළඟ කාරණාව වාහන ලියාපදිංචියේදී සභාවේ නිලධාරීන් විධිමත්ව ක්‍රියාත්මක වී නැහැ. වෑන් රථ ලියාපදිංචි නොකිරීම නිසා සභාවට ලැබිය යුතු විශාල මුදලක් අහිමි වී තිබෙනවා. අප සභාවට අයත් අළුතින් ඉදිකරන ලද වෙළඳසැල් මගින් ලැබිය යුතු කුලිය සංශෝධනය කර නැති බව ප්‍රකාශ කළ යුතුයි. මුදල් ලැබිය යුතු මාර්ග ක්‍රියාත්මක කල යුතුයි. වෙනත් ප්‍රදේශවල සිට වෙළෙඳ කටයුතු සඳහා මස්කෙළිය නගරයට පැමිණෙන වාහන සඳහා ගාල් කිරීමේ ගාස්තු අය කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ හැකියි. නැවතත් සතිපොල ක්‍රියාත්මක කළ යුතුයි. පිටපලාත් වල සිට රැගෙන එන එළවළු වල මිල අහස උසට නැග තිබෙනවා. මේ පිළිබඳව අවධානය යොමුකර ගිනිගත්හේන ප්‍රදේශයේ දක්නට ලැබෙන එළවළු අඹගමුව ප්‍රාදේශිය සභාව සමග සම්බන්ධ වී ලබා ගැනීමට උත්සාහ කළ හැකියි. එමෙන්ම කොටගල, නෝර්වුඩ් කියන්න ප්‍රාදේශීය සභාවල ද සහයෝගය ලබාගත හැකියි. මෙම සභා හතරම එකතුවී පොදු මධ්‍යස්ථානයක් ස්ථාපිත කර භාණ්ඩ එකතු කිරීමට කටයුතු කල හැකියි. මෙම කරුණු ක්‍රියාත්මක කිරීමේ දී යම් ගැටළු මතුවිය හැකියි. නමුත් උත්සාහ කිරීම අපගේ වගකීමක්. අපගේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුල පිහිටි ප්‍රදේශවල ගොවිතැන් කරන ගොවීන්ට අපගේ සභාව මගින් නිෂ්පාදනය කරන කාබනික පොහොර සහනදායි මිලකට හෝ නොමිලයේ ලබාදීමට ඉදිරිපත් විය යුතුයි. සභාව යටතේ ක්‍රියාත්මක වන රථගාල් සඳහා බලපත්‍ර ලබාදී මුදල් රැස් කිරීම සම්බන්ධයෙන් රුපියල් හාරලක්ෂ හැටපන්දහසක මුදලක් සභාවට පාඩු වී තිබෙනවා. අඹගමුව කාලයේදි බැලුවොත් රුපියල් ලක්ෂ අටක්, ලක්ෂ නවයක්. මෙහිදී අපි නොසැලකිලිමත් වී තිබෙනවා. වාහන 31 ක් තිබෙනවා. ලොරි රථ මෙයට සම්බන්ධ නැහැ. මෙතරම් ප්‍රමාණයක් අපි ලබා නොගෙන, දැන් එක්තරා ක්‍රමයකට ඔවුන් ගෙවීමට සූදානම් නැහැ. එය කොහොමද අපි ලබාගන්නේ යන්න පිළිබඳව එක්තරා ක්‍රමවේදයක් සකස් කළ යුතුයි.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ස්ථිර කරන අතර, කාබනික පොහොර සම්බන්ධයෙන් ගරු මන්ත්‍රිතුමා සඳහන් කර තිබුණා. යෝජනාවක් ඉදිරිපත් කරන අවස්ථාවේදී පමණක් ඒ පිළිබඳව ඉතාමත් උනන්දුවෙන් අපි කතා කරනවා. එහි වැදගත්කම සියළුම දෙනා දන්නවා. කොවිඩ් වසංගත අවස්ථාවේදී සියළුම දෙනාට ගොවිතැන් කිරීමේ තත්වයක් උදා වුණා. එනිසා අප විසින් නිෂ්පාදනය කරන පොහොරවල ගුණාත්මකභාවය තවත් වැඩිකර වෙළඳපොළට නිකුත් කිරීම සඳහා සභාව කටයුතු කළ යුතුයි. මේ හා සම්බන්ධව රජයේ ආයතන බොහෝමයක් තිබෙනවා. එම ආයතනයන්ගෙන් උපදෙස් සහ සහයෝගය ලබාගත හැකියි. අවශ්‍ය නම් ඒ සඳහා වූ සම්බන්ධකම් මම ගොඩනගා දෙන්නම්. කඩයක් ඉදිකිරීම සහ වෙනත් වියදම් දෙස බලන විට ඉන් ලාභයක් ලබා

ගෙන තිබෙනවාද කියන එක සැකයි. රාජ්‍ය නොවන ආයතන ද සම්බන්ධ කරගනිමින් අපි සාකච්ඡාවක් සිදු කරමු. සාමිමලේ ප්‍රදේශයේ ද පොහොර කඩයක් ආරම්භ කළ හැකියි. මේ සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කළ යුතුයි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

රථගාල් ලියාපදිංචි කිරීම සඳහා කටයුතු සිදුවෙමින් පවතිනවා. කඩිනමින් ඒ සඳහා වූ ක්‍රියාමාර්ග ලබා ගන්නවා. පසුගිය මූදල් කමිටු සාකච්ඡාවේදී සති පොල ආරම්භ කිරීම සඳහා සාකච්ඡා සිදු වුණා. නමුත් නිලධාරීන් එය වාර්තාවට ඇතුළත් කර නැහැ. එබැවින් ඒ සඳහා වූ ක්‍රියාමාර්ග ද ලබා ගන්නවා. ඒ වගේම කාබනික පොහොර නිෂ්පාදන ප්‍රමිතිය තවදුරටත් වැඩි කිරීම සඳහා ක්‍රියාමාර්ග ලබාගනිමින් තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී ඒ.රවින්ද්‍රරාජා මැතිතුමා (එ.ජා.ප)</u>**

තැපැල් කාර්යාලය අසල පිහිටි රථගාල් ලියාපදිංචිය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා යෝජනාවක් ඉදිරිපත් කර තිබුණා. පසුගිය සභා වාරයේදී වෑන් රථ ගාල් පිළිබඳව අපිත් යෝජනාවක් ඉදිරිපත් කර තිබුණා. ඒ අනුව එදිනම අපගේ නිලධාරීන් වෑන් රථ ගාල සලකුණු කර පදික මාර්ගය වෙන් කර දුන්නා. එහි පිහිටි වෙළඳසැල් හිමිකරුවන්ට ගැටළු මතුවූ නිසා අපි එය වෙන්කර දුන්නා. දැනට එහි ගැළුවක් නැහැ. නමුත් ඒ වැඩසටහන නියමිත පරිදි ක්‍රියාත්මක වී නැහැ. පදික වේදිකාව සඳහා වෙන්කර දුන්නොත් එම පදික වේදිකා වැට ඉදිකිරීම සඳහා යකඩ ලබාදෙන බවට වෙළඳුන් පවසනවා. ඒ වගේම සති පොල නැවතත් ආරම්භ කිරීම හොඳ කාර්යයක්, ඒ සඳහා වූ ස්ථානයද තෝරා ගත්තොත් යහපතක් වේවි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

එය පදික වේදිකාවක් වශයෙන් ලබාදීම සඳහා තමයි සලකුණු කලේ. තැපැල් කාර්යාල මාර්ගයේ වෙන් කර දෙමු. මීළඟට ගරු මන්ත්‍රී එස්. සුරේෂ් කුමාර් මැතිතුමාගේ විශේෂ යෝජනාව ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**

අද දිනට කාලෝචිත වූ යෝජනා කීපයක් මම ඉදිරිපත් කර තිබෙනවා. මස්කෙළිය කොට්ඨාශයේ දැනට වඳුරන්ගේ ගැවසීම සහ පීඩාව වැඩි වී තිබෙනවා. ගම්මානවලට සහ සෑම තැනකටම යනවා. ගෙවල්වල බඩු සහ ඇඳුම් පවා තියන්න බැහැ. ජනතාව මෙනිසා විශාල පීඩාවකට පත්ව සිටිනවා. වතුකරයේ මෙම පීඩාව අඩු වී තිබුණ ද නගරයේ වැඩිවී තිබෙනවා. වෙළෙඳ සැල්, හෝටල්, ගෙවල් සහ පාසැල් වැනි සෑම ස්ථානයකටම යන නිසා පීඩාව වැඩි වී තිබෙනවා. මේ සඳහා අපට ක්‍රියාමාර්ග ගන්න බැහැ. නමුත් මේ සඳහා තීරණයක් ලබා ගන්න පුළුවන්. සතුන්ගේ පීඩනය වැඩි බව සඳහන් කරමින්, එම සතුන් මරණයට පත් නොකර ආරක්ෂා සහිතව කැලෑ ප්‍රදේශයට රැගෙන යාම සඳහා අදාල වනජීවී අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කරන ලෙසට ඉල්ලා සිටිමි.

**තීරණ අංක 16**

එකී කාරණාව සම්බන්ධයෙන් වනජීවී අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කිරීමට තීරණය කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**

මස්කෙළිය ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට අයත් නල්ලතන්නිය, ලකම් වැනි ප්‍රදේශ නගරබද ප්‍රදේශ වශයෙන් ඇතුලත් කරගැනීමට කටයුතු කරන්නේ නම්, මෙය මස්කෙළිය නගරයේ පෝෂක ප්‍රදේශ

වශයෙන් පරිවර්තනය වේවි. ඉදිරි කාලයේදී සංවර්ධිත ප්‍රදේශයක් වශයෙන් පරිවර්තනය වේවි යන කාරණාව සමග අතුරුපනතට යටත්ව මේ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග ලබා ගන්නා ලෙසට ඉල්ලා සිටිමි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මේ සඳහා ලකම් ප්‍රදේශයේ පසුගිය දිනවල රැස්වීමක් සංවිධානය කර තිබුණා. ඒ වගේම අනෙකුත් ස්ථානවල ද එවැනි රැස්වීම් පවත්වන ලෙසට අපි පවසා තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
මම සහ ගරු මන්ත්‍රී නිත්‍යානන්දන් මැතිතුමා සම්බන්ධ වී ග්‍රාමනිලධාරී සමඟ සාකච්ඡා කර රැස්වීමක් සංවිධානය කරන්නම්. එලෙස සිදුකලහොත් අනාගතයේදී හොඳ තත්වයකට පත්විය හැකියි. සීමා නිර්ණය සභාව මගින් මායිම් සලකුණු කිරීමේ දී ප්‍රාදේශීය සභා සියල්ල අනුයුක්ත කරන බවට සඳහන් වෙනවා. එවැනි අවස්ථාවකදී මස්කෙළිය ප්‍රාදේශීය සභාව, අඹගමුව ප්‍රාදේශීය සභාව සමඟ අනුයුක්ත වන්නේ නම් මස්කෙළිය ප්‍රදේශයේ සංවර්ධන කටයුතු අඩුවෙන්න ඉඩ තිබෙනවා. එනිසා මේවා නගර වශයෙන් ප්‍රසිද්ධ කිරීම යහපතක් වේවි.

**<u>ගරු මන්ත්‍රී කේ.නිත්‍යානන්දන් මැතිතුමා (ලං.ක.කො)</u>**
නල්ලතන්නිය නගරයක් වශයෙන් ප්‍රකාශයට පත් කරන්නේ නම් නල්ලතන්නියේ ද සති පොළක් ආරම්භ කිරීමට කටයුතු කරන්න.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ඔබතුමා සංවිධානය කරන්න, සභාව මඟින් සිදු කළ යුතු දේවල් සඳහා අපි කටයුතු කරන්නම්.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
නල්ලතන්නිය ප්‍රදේශයේ පිහිටි අපගේ වැන් රථ ගාල අඩුවීගෙන යනවා. මෙයට හේතුව කුමක්ද කියලා දන්නේ නෑ. නායයෑමක් නම් පස් කඩා වැටී බිමට පාත් වෙන්න ඕන. මෙහිදී ඉඩ ප්‍රමාණය අඩුවීගෙන යනවා. වෙළඳසැල්, ගෙවල් ආදිය ඉදිරියට එනවා. මේ වගේ ගියොත් වැන් රථ ගාල නැති වී යාවි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මේ කාරණාව සම්බන්ධයෙන් මම සොයා බලන්නම්.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
මීළඟ කාරණාව හිටපු රාජ්‍ය අමාත්‍ය සහ වත්මන් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජීවන් තොන්ඩමන් මැතිතුමාගේ විශේෂ නිර්දේශයක් වශයෙන් පාර්ලිමේන්තුවේ සඳහන් කරමින් එතුමා විසින් නගන ලද හඬ බලවත් කිරීම සඳහා මෙම යෝජනාව මම ඉදිරිපත් කරමි. හැටන් නගර සභාව මහනගර සභාවක් වශයෙන් සංශෝධනය කිරීමට කටයුතු කර ඇති බවටත් අනෙකුත් සියළුම සභා ඊට සාපේක්ෂ වශයෙන් මහනගර සභා සහ නගර සභා වශයෙන් සංශෝධනය කිරීමට කටයුතු කර ඇති බවට ද සඳහන් වෙනවා. ඒ අනුව සියළුම සභා සංවර්ධන කිරීම සඳහා ආදර්ශයක් අපගේ සභාව මගින් සිදු කළ නොහැකියි. එතුමාගේ උත්සහය බලවත් කිරීම පිණිස අපගේ සභාව මගින් යෝජනාවක් ඉදිරිපත් කරමින් පවසන ලද කාරණාව අනිවාර්යයෙන් ක්‍රියාත්මක කළ යුතුයි. ඒ අනුව මෙම සභාව මගින් එකී කාරණාව ඉදිරියට රැගෙන යන ලෙසට ඉල්ලා සිටිමි. ගරු පාර්ලිමේන්තු

මන්ත්‍රී අමාත්‍ය ජීවන් තොන්ඩමන් මැතිතුමාටද පාර්ලිමේන්තුවට ද ජනාධිපතිතුමාට ද අදාල අමාත්‍යාංශයේ ලේකම්තුමාට ද මේ පිළිබඳව ලිපි යොමු කරන ලෙසට ඉල්ලා සිටිමි. මීළඟ කාරණාව වන්නේ අත්‍යවශ්‍ය භාණ්ඩ වල මිල අඩු කර තිබෙනවා. ජනතාවගේ ආදායම ඉතාමත් අඩු මට්ටමින් පවතිනවා. මිල අඩු කරන ලද භාණ්ඩවල මිල අප නගරයේ ද අඩු කිරීමට කටයුතු කළ යුතුයි. භාණ්ඩ ප්‍රවාහනය පදනම් කර ගනිමින් මෙම මිල අඩු කිරීම් සිදු කරනවා. නමුත් අප ප්‍රදේශයේ ජීවත්වන අය හැටන් නගරයට ගොස් භාණ්ඩ මිල දී ගන්න බැහැ. ප්‍රවාහන වියදම් අධිකයි. එමනිසා මේ පිළිබඳව අදාළ අමාත්‍යාංශය වෙත දැනුවත් කරමින් අපගේ සභාව ආදර්ශමත්ව කටයුතු කරන්නේ නම් එය සුදුසු බවට සඳහන් කරමි.

**තීරණ අංක 17**
එකී කාරණාව සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කිරීමට තීරණය කරන ලදී.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මේ සමඟ අද දින මෙම සභාව සාර්ථකව පවත්වාගෙන යාමට සහයෝගය ලබාදීම පිළිබඳව ස්තූතිවන්ත වෙමින් මෙයින් සභාවේ වැඩ කටයුතු අවසන් කර සිටිමි.

ස්තූතියි.
ආයුබෝවන්.

සභාපති,
මස්කෙළිය ප්‍රාදේශීය සභාව,
මස්කෙළිය.

ලේකම්,
මස්කෙළිය ප්‍රාදේශීය සභාව,
මස්කෙළිය.